**ශීර්ෂ 180 - සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව

| ශිර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

## 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 180 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 2015.07.30 |
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2015.06.24 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,035.34 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 929.03 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 25.42 ක් හා රු.මිලියන 80.89 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 10.28 ක් හා සියයට 10.26 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂය** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 180 | 247.05 | 221.63 | 25.42 | 10.28 |
| 289 | 788.29 | 707.40 | 80.89 | 10.26 |
| එකතුව | **1035.34** | **929.03** | **106.31** | **10.27** |

**(ආ) වෙනත් අමාත්‍යාංශයක් විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය වෙත රු.මිලියන 111.56 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණි. ඉන් රු.මිලියන 72.08 ක් උපයෝජනය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 39.48 ක් ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18001 | 30.0 | 23.9 | 20.0 | 23.1 | 120.0 | 83.1 |
| 28901 | 3.5 | 4.0 | 1.0 | 3.1 | 12.0 | 7.3 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 2.78 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0189/000 | 3,700 |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0144/000 | 2,779,741 |
| **එකතුව** | | **2,783,441** |

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

# 3. ශීර්ෂ 180 - සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ආ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇනවුම් ආදිය සඳහා ලේඛනය | මුදල් රෙගුලාසි 451 | විධිමත්ව පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ඈ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ඉ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ /අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඊ) | ලංසු කැඳවීමේ ලේඛනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (උ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | විධිමත්ව පවත්වා නොතිබුණි. |

## 3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.24,070,846 ක් විය.

## 3.3 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන සඳහා අවශ්‍ය අග්‍රිම ඉල්ලීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. 180-2-3-1-2201 වැය විෂය සඳහා සළසා තිබුණු රු.මිලියන 50 ක

ප්‍රතිපාදනයෙන් රු.මිලියන 39.5 ක් උපයෝජනය කර තිබුණු අතර, ඉතිරි වූ රු.මිලියන 10.5 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 18001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේදී ගෙවන ලද රු.119,700 ක ආපදා ණය මුදලක් සඳහා ඇපකරුවෙකු ලෙස රජයේ සේවයේ නොවන නිලධාරියෙකු පිළිගෙන තිබුණි.

(ආ) 2013 වර්ෂයේ ඌව පළාත් සභාවේ සිට ස්ථාන මාරුවී පැමිණි නිලධාරියෙකුගේ ණය ශේෂය පවරා නොගෙන වාරික වශයෙන් නිලධාරියාගේ වැටුපෙන් අවකරණය කර පළාත් සභාව වෙත ප්‍රේෂණය කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට රු.83,050 ක ණය ශේෂය අයකළ බවට හෝ පියවූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර එය සාමාජික ණය ලේඛණයෙන්ද ඉවත්කර තිබුණි.

**3.5 අග්‍රිම ගිණුම**

මුදල් රෙගුලාසි 371 ට පටහැනිව අවස්ථා 03 කදී නිලධාරීන් තිදෙනෙකු වෙත රු.20,000 ක සීමාව ඉක්මවූ එකතුව රු.69,716 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.7 බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයට අඩු බැරකම් ප්‍රමාණය රු. 1,838,715 ක් වී තිබුණි.

## 3.8 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XXIV පරිච්ඡේදයේ 3.5 හා 3.17.2 වගන්ති | - | ඒකාබද්ධ වැටුපෙන් සියයට 40 ක අදාළ අවකරණ සීමාව ඉක්මවූ නිලධාරියෙකු වෙත ආපදා ණය ලබාදී තිබුණි. එසේ වූ තවත් නිලධාරියකු ඇපකරුවකු ලෙසද පිළිගෙන තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| **(i)** මුදල් රෙගුලාසි 104 (3)(4) | 130,544 | 2014 දෙසැම්බර් 30 දින වාහනයක වාමුවාව බිඳී යෑම නිසා සිදු වූ අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | 356,665 | 2014 ඔක්තෝබර් 24 දින අමාත්‍යාංශ භූමියේදී වාහන දෙකක් එකිනෙක ගැටීමෙන් සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | මුදල් රෙගුලාසි 1642 | 487,209 | සමාලෝචිත වර්ෂයේ දී වාහන තුනකට සිදුව තිබූ අනතුරු සම්බන්ධයෙන් පොලිසීය වෙත වාර්තා කර නොතිබුණි. |

## 3.9 කාර්යසාධනය

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

අමාත්‍යාංශයේ අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි විගණන පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2014 නොවැම්බර් 21 දින අරලියගහ මන්දිරයේ පැවති ජාතික ගොවි සම්මේලනයේ රැස්වීමකට සහභාගීවූ අයවලුන් 3,600 කට දිවා අහාර සැපයීමට රු.904,781 ක් වැය කර තිබුණි.

(ආ) ජනාධිපති පදවි ප්‍රාප්තිය වෙනුවෙන් 2014 නොවැම්බර් 14 දින දිණමිණ පුවත්පතෙහි සම්පූර්ණ පිටුවක දැන්විමක් පළකිරීම වෙනුවෙන් රු.196,560 ක් වැය කර තිබුණි.

## 3. 10 අනාර්ථික ගනුදෙනු

2014 ප්‍රගති වාර්තාව සහ 2015 සංවර්ධන වැඩසටහන් ඇතුළත් පොත් 100 ක් පෞද්ගලිත ආයතනයකින් මුද්‍රණය කර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.632,884 ක් වැයකර තිබුණි.

## 3.11 විසඳා නොතිබුණු විගණන ඡේද

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2011 | 09 | කුළුබඩු හා ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන මණ්ඩලයේ වත්කම් පාලනය හා ආරක්ෂා කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබුණත් මණ්ඩලය ඈවර කර ඈවර ගිණුම් පිළියෙල කිරීම සිදුකර නොතිබුණි. |

## 3.12 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 10 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 51 | 33 | 18 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 24 | 03 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 02 | - | 02 |
| | **එකතුව** | **95** | **68** | **27** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 27 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය සේවයේ යෙදිය හැකි උපරිම වයස් සීමාව අවුරුදු 60 ක් වුවද, එම සීමාව ඉක්මවූ තැනැත්තෙකු අමාත්‍ය කාර්ය මණ්ඩලයේ රියදුරෙකු ලෙස බඳවා ගෙන 2010 නොවැම්බර් 23 දින සිට 2014 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ වැටුප් හා දීමනා වශයෙන් රු.1,052,764 ක් ගෙවා තිබුණි. තවද එම රියදුරු වෙනුවෙන් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට දායක ලෙස රු.33,254 ක් වැය කර තිබුණද, මොහු වයස අවුරුදු 60 ඉක්මවා

තිබූ බැවින් එම මුදල ආපසු අමාත්‍යාංශය වෙත එවා තිබුණු අතර එය නැවත එම රියදුරුට ගෙවා තිබුණි.

(ඇ) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ 2.2 ඡේදය පරිදි අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ රියදුරු තනතුරේ සිට පෞද්ගලික සහකාර තනතුර දක්වා සේවකයින් බඳවා ගැනීමේදී රජයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ සුදුසුකම් සපුරා තිබිය යුතු බව දක්වා තිබුණත්, අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයට බඳවාගෙන සිටි 22 කගේ සුදුසුකම් සනාථ කරගෙන නොතිබුණි.

## 4. ශීර්ෂ 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 4.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 සිට සියයට 79 දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

### 4.2 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.567,791 ක්වූ තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 4.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 28901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව සේවකයින් 05 දෙනෙකුගෙන් අයවීම් හිඟහිට තිබුණු වසර 03 සිට වසර 13 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණු එකතුව රු. 671,553 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**4.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී එක් රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ගකර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පවතී නම් එසේ පවතින කාලය |
|---|---|---|
| (i) ඉඩම් හා ගොඩනැගිලි | 01 | වසර 34 කට පෙර |
| -එම- | 01 | කාලය ඉදිරිපත් කර නැත |
| (ii) මෝටර් වාහන | 05 | වසර 01 සිට වසර 10 දක්වා |

**4.6 විදේශාධාර ව්‍යාපෘති**

**ව්‍යාපෘතියේ වත්කම් නිෂ්ක්‍රියව පැවතීම**

2009 වර්ෂයේ කොරියානු රජයේ (KOICA) මිත්‍රත්ව සංගමය මඟින් ලබාදුන් ආධාර උපයෝගී කරගෙන 2009 නොවැම්බර් 16 දින වන විට ගොඩනැගිල්ලක් ඉදිකර, කෘෂි නිෂ්පාදන ඇසුරුම් ව්‍යාපෘතියකට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සපයා සවිකර තිබුණද, 2015 ජූලි 08 දින වන විටද එම ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කර නොතිබුණි.

**4.7 පාඩු හා හානි**

2012 වර්ෂයේ දී සොරකම් කරන ලද රු.2,400,000 ක වටිනා වාහනය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදුකළ යුතු කටයුතු 2015 ජූලි 08 දින වන විටද අවසන් කර නොතිබුණි.

**4.8 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 51 | 34 | -- |
| (ii) තෘතියික මට්ටම | 28 | 09 | 19 | -- |
| (iii) ද්විතියික මට්ටම | 800 | 604 | 196 | -- |
| (iv) ප්‍රාථමික මට්ටම | 353 | 424 | -- | 71 |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 97 | 09 | 88 | -- |
| **එකතුව** | **1,363** | **1,097** | **337** | **71** |